# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2016 ජූනි මස 21 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු කේ.ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-04-05 වන දින අසන ලද ප්‍රශ්නය.

(ප්‍ර/vi(1)/16/30)

(අ). 2000 වර්ෂයේ සිට මේ දක්වා පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ ඉදිරිපත් කළ යෝජනා ගණන කීයද?

(ආ). ඉන් සාකච්ඡාවට (විවාදයට) භාජනය කළ ගණන කීයද?

(ඇ). ඉවත් කරගත් හෝ ප්‍රතික්ෂේප කළ ගණන කීයද?

(ඈ). ඒකඡන්දයෙන් සම්මත වූ ගණන කීයද?

(ඉ). වැඩි ඡන්දයෙන් සම්මත වූ ගණන කීයද?

(ඊ). පරාජයට පත් වූ යෝජනා ගණන කීයද?

(උ). එකී යෝජනා අතරින් අධ්‍යාපන, සෞඛ්‍ය, සමූපකාර, නීති හා ප්‍රඥප්ති, ප්‍රවාහන වශයෙන් එක් එක් විෂයට අදාල යෝජනා කොපමණද?

(ඌ). එම සම්මත වූ යෝජනා අතරින් මේ වන විට ක්‍රියාත්මක වූ යෝජනා මොනවාද? කුමන වර්ෂයේ සිටද? කුමන අමාත්‍යාංශය යටතේද?

(එ). වාර්ෂිකව අය-වැය යෝජනා සාකච්ඡාවේදී මෙම සම්මත යෝජනා කෙරෙහි අවධානය යොමු කර සලකා බලා තිබේද? ඒ කුමන වසරේද?

(ඒ). සභාවේ මන්ත්‍රීවරුන්ගේ සම්මත යෝජනා ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකසා තිබේද? එසේ නම් එය කුමක් ද?

(ඔ). සම්මත වූ යෝජනා ක්‍රියාත්මක නොකරන්නේ කාගේ නොහැකියාව නිසාද? ඒ සඳහා වගකිවයුත්තේ කවුද?

(ඕ). මෙතෙක් සම්මත යෝජනා නැවත සලකා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට මෙම සභාවෙන් කමිටුවක් පත් කිරීම සුදුසු බව අදහස් කරන්නේද? එසේනම් ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

2. ගරු කේ.ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2015-05-17 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/vi(1)/16/42)

(අ). හොරණ අධ්‍යාපන කලාපයේ සේවයේ නියතු නිරෝෂන් නවගමුවගේ ගුරුමහතා සම්බන්ධව විනය ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද? ඒ කුමන විනය විරෝධී ක්‍රියාවක් සම්බන්ධවද?

(ආ) එසේ විනය විරෝධී ක්‍රියාවක් සිදුකළ බවට වන මුල් පැමිණිල්ල කවුරුන් විසින් යොමු කර තිබේද? එහි සත්‍ය අසත්‍යතාවය තීරණය කිරීමට මුල් අවස්ථාවේ මූලික පරීක්ෂණයක් සිදු කළේද? කවුරුන් විසින්ද? නිරීක්ෂණ මොනවාද?

(ඇ). ප්‍ර/iv(i)/16/24 අංක දරණ මාගේ ප්‍රශ්නයට ඔබතුමා ලබාදුන් පිළිතුරෙහි සඳහන් කුමන විනය නීති සංග්‍රහය හෝ වෙනත් නීතියක් මෙම ගුරුවරයා උල්ලංඝණය කර තිබේද?

(ඈ). බප/පාලන/12/හෝ/86 සහ 2016-02-05 දිනැති පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ ලිපිය මගින් අදාල ගුරුවරයා චෝදනාවලින් නිදහසට කරුණු විමසා ඇති බව ඔබතුමා දන්නේද?

(ඉ). ප්‍ර/iv(i)/16/24 අංක දරණ ප්‍රශ්ණයට ලබා දී ඇති පිළිතුරු සමග ඉහත "ඈ" හි සඳහන් ලිපියේ අන්තරගතය හා නොගැලපෙන බව ඔබතුමා පිළිගන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

(ඊ). හොරණ අධ්‍යාපන කලාපයේ නිලධාරීන් විසින් මෙම ගුරුවරයා සම්බන්ධයෙන් ද්වේශ සහගතව අසත්‍ය චෝදනාවක් සම්බන්ධයෙන් කරුණු හා නෛතික පදනමක් නොමැතිව ක්‍රියාකර ඇති බව ඔබතුමා පිළිගන්නේද? නොපිළිගන්නේ නම් ඊට හේතු මොනවාද?

3. ගරු එච්.එම්. උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-06-07 වන දින අසන ලද ප්‍රශ්නය.

( ප්‍ර/vi(1)/16/45 )

(අ). බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශයට 2015 වර්ෂයේ අයවැයෙන් මුදල් කොපමණ වෙන්කර ඇත්ද?

(ආ). එම මුදලින් පළාත් පාලන මාර්ග සඳහා වෙන්කර ඇති මුදල කොපමණද?

(ඇ). එම මුදලින් දැනට කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම නගර සභා බලප්‍රදේශයේ මාර්ග කොපමණ කාපට් කර ඇත්ද?

(ඈ). ඒ මාර්ග මොනවාද?

(ඉ). එම මාර්ගයෙන් මාර්ගයට වෙන්කළ මුදල කොපමණද?

(ඊ). එම මාර්ග කුමන පදනමක් යටතේ කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇත්ද?

(උ). මුදල් කොමිෂන් සභාව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛණයට අනුව පළාත් පාලන මාර්ග සෑදීමට බලය දී ඇත්ද?

(ඌ). එසේනම් එම චක්‍රලේඛය කුමක්ද?

4. ගරු එච්.එම්. උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-06-07 වන දින අසන ලද ප්‍රශ්නය.

( ප්‍ර/vi(1)/16/46 )

(අ). බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද?

(ආ). මේ වන විට කොපමණ විසුරුවා ඇත්ද?

(ඇ). කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක මට්ටමින් ඒ මොනවාද?

(ඈ). I. මහරගම නගර සභාවේ ඡන්දයෙන් පත්වූ මන්ත්‍රී මණ්ඩලය කොපමණ සිටියාද?

II. එම මන්ත්‍රීවරුන් තේරීපත් වූයේ කුමන පක්ෂ වලින්ද?

(ඉ). I. 2016 වර්ෂයේ අයවැයෙන් මහරගම නගර සභාව වෙත කොපමණ මුදලක් වෙන්කර ඇත්ද?

II. එම අයවැයෙන් මාර්ග සංවර්ධනය සඳහා මුදල් කොපමණ වෙන්කර ඇත්ද?

(ඊ). මාර්ග කොපමණ සාදා නිමකර ඇත්ද?

(උ). ටෙන්ඩර් පටිපාටිය යටතේ නිම කර ඇති කොන්ක්‍රීට් පාරවල්, තාර පාරවල්, ඉන්ටර්ලොක් ගල් පාරවල්, කාපට් පාරවල් ගණන කීයද?

(ඌ). I. මහරගම නගර සභාවේ හිටපු මන්ත්‍රීවරුන් හට මාර්ග සංවර්ධනය සඳහා මුදල් කොපමණ වෙන් කර ඇත්ද?

II. ඒ මන්ත්‍රීවරුන් කවුරුන්ද?

III. ඒ කුමන මාර්ගයන්ද?

(එ). I. ටෙන්ඩර් ක්‍රමයෙන් බැහැරව දී ඇති මාර්ග කොපමණ තිබේද?

II. එසේ ලබා දී ඇති සමිති මොනවාද?

III. කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද?

(ඒ). I. එම මාර්ග වලට මුදල් වෙන් කිරීමේ බලයක් ඔබතුමාට තිබේද?

II. ඒ කුමන නීතියක් යටතේද?

(ඔ). බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු 104 දෙනාට මෙම පළාත් පාලන ප්‍රදේශවල පාරවල් සෑදීමට මුදල් නොදෙන්නේ මන්ද?

5. ගරු එච්.එම්. උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-06-07 වන දින අසන ලද ප්‍රශ්නය.

(ප්‍ර/vi(1)/16/47)

(අ). බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමය මගින් සංවිධානය කරන ලද චීන සංචාරය පිළිබඳ ඔබතුමන් දන්නෙහිද?

(ආ). එම සංචාරය කුමන ව්‍යාපෘතියක් යටතේ අනුමත වූ සංචාරයක්ද?

(ඇ). එම සංචාරය සඳහා කී දෙනෙකු සහභාගී වුවාද?

(ඈ). ඒ කුමන ආයතනවල කුමන තනතුරු දරණ අයද?

(ඉ). එම සංචාරය සඳහා පළාත් සභා මන්ත්‍රීන් කී දෙනෙකු සහභාගී වුවාද?

(ඊ). මහරගම නගර සභාවේ සේවකයෙකු මෙම සංචාරය සඳහා සහභාගී වූවාද? ඒ කෙසේද?

(උ). පළාත් සභාවක හෝ සමූපකාරයක සාමාජික නොවන අය සහභාගී වූවාද?

(ඌ). සහභාගි වූවානම් ඒ පුද්ගලයින් කවරහුද?

(එ). ඒ අය සඳහා මුදල් වෙන් කළේ කුමන පදනම මතද?

(ඒ). නීතියට අනුව එසේ මුදල් වෙන් කළ හැකිද?

6. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට :

( ප්‍ර/vi(1)/16/49 )

(අ) I. කළුතර ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක මොරොන්තුඩුව සතිපොළ කඩා ඉවත්කර ඇතිබව ඔබතුමා දන්නේද?

II. එසේනම් ඒ කවදාද?

III. කොපමණ කාලයක් සඳහාද?

(ආ) I. නව ඉදිකිරීමක් සඳහා මුල්ගල තබා ඇති බව ඔබතුමා දන්නෙහිද?

II. ඒ කවදාද?

III. කොපමණ කලකින් වැඩ නිමකිරීම සඳහාද?

(ඇ) I. මෙම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු ගිවිසුම්ගතවී ඇත්තේ කුමන ආයතන සමඟද?

II. මේ සඳහා මුදල් ලබාදෙන්නේ කුමන ආයතන මගින්ද?

(ඈ) I. මෙම කොන්ත්‍රාත් සමාගමේ නම හා ලිපිනය කුමක්ද?

II. එම සමාගමේ අයිතිකරුගේ නම හා ලිපිනය කුමක්ද?

(ඉ) I. මෙතෙක් වැඩ නිමකිරීමට නොහැකිවී ඇති හේතුව කවරේද?

II. ඒ පිළිබඳව පළාත් පාලන ආයතනය ගෙන ඇති පියවර කවරේද?

(ඊ) I. දැනට සතිපොළ පවත්වා ගෙන යන ස්ථාන ඔබතුමා දන්නෙහිද?

II. ඒ කුමන ස්ථානයේද?

III. ඒ හේතුකොටගෙන වෙළඳුන් හා මහජනතාව මුහුණපාන දුෂ්කරතා පීඩා සඳහා ප්‍රාදේශීය සභාව ගෙන ඇති පියවර කවරේද?

Iv. ඒ මොනවාද?

(උ) I. දැනට මෙම සතිපොළ පවත්වාගෙන යන ස්ථානයෙන් ප්‍රාදේශීය සභාව බදු මුදල් අයකරන්නේද?

II. ඒ කොපමණද?

7. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට : ( ප්‍ර/vi(1)/16/50 )

(අ) I. කළුතර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප කීයක් තිබේද?

II. ඒ මොනවාද?

III. එම කලාප මට්ටමින් වර්ෂ 2015 දී අ.පො.ස. (සා/පෙළ) විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

Iv. එම විභාගයෙන් සමත් හා අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

v. කලාප අනුව කොපමණද?

(ආ) I. ගණිත විෂය පමණක් අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

II. එය කලාප අනුව කොපමණද?

(ඇ) I. පාසල් මට්ටමින් මෙම විභාගය සඳහා පෙනී සිට ඉදිරිපත් වූ සියලුමදෙනා ගණිත විෂය පමණක් අසමත් පාසල් තිබේද?

II. ඒ කුමන පාසල් ද?

(ඈ) I. ඊට හේතුවී ඇති කරුණු පිළිබඳව ඔබ අමාත්‍යංශය මගින් පරීක්‍ෂණයක් කර තිබේද?

II. පරීක්‍ෂණයේ ප්‍රතිඵලය කුමක්ද?

(ඉ) I. මෙම පාසල් වල ශිෂ්‍යයන් සඳහා අසාධාරණයක් සිදුවී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

II. මේ සඳහා ගන්නා පියවර කවරේද?

8. ගරු යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්‍ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට : ( ප්‍ර/vi(1)/16/51 )

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ 2016 වසර පාසල් වලට ළමුන් ඇතුලත් කිරීමේදී පොලීසිය හා ත්‍රිවිධ හමුදා වල සේවයේ (ක්‍රියාත්විත) නියුතු අයගේ දරුවන් ඇතුලත් කිරීම සඳහා කොපමණ පුරප්පාඩු සංඛ්‍යාවක් වෙන් කළේද?

(ආ) එම පුරප්පාඩු අධ්‍යාපන කලාප හා පාසල් මට්ටමින් වෙන් වෙන් වශයෙන් දක්වන්නේද?

(ඇ) එම පුරප්පාඩු සඳහා ක්‍රියාත්විත වල නියුතු අයගේ දරුවන් ඇතුලත් කිරීමෙන් පසු ඉතිරිවූ පුරප්පාඩු සඳහා පළාත් සභා ධූරධාරීන්ගේ, මන්ත්‍රීවරුන්ගේ නිර්දේශ මත දරුවන් ඇතුලත් කළ බව ඔබතුමා පිළිගන්නේද?

(ඈ) එසේ නම් එම පාසල් හා පිරවූ පුරප්පාඩු සංඛ්‍යාව හා ඒ . කිනම් පළාත් සභා මන්ත්‍රී හා ධූරධාරීන්ගේ නිර්දේශ මතද?

(ඉ) එක් එක් මන්ත්‍රීවරයාගේ, ධූරධාරියාගේ නිර්දේශ මත 2016 වසර පළමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කරගත් ආකාරය පිළිබඳව පාසල් ඇතුළුව ලිඛිත වාර්තාවක් දෙන්නේද?

(ඊ) සමහර මන්ත්‍රීවරුන්ට එකදු දරුවෙක් හෝ ඇතුලත් කරගැනීමට අවස්ථාව අහිමිවූ බව පිළිගන්නේද?

(උ) සමහර මන්ත්‍රීවරුන්ට, ධූරධාරීන්ට ළමුන් වැඩි සංඛ්‍යාවක් ඇතුලත් කරගැනීමටත්, තවත් කොටසකට එක් අවස්ථාවක්වත් නොලැබීමටත් හේතු දක්වන්නේද?

(ඌ) මෙම පුරප්පාඩු මන්ත්‍රීවරුන් අතරේ බෙදාදීම ප්‍රධාන අමාත්‍යතුමාගේ නිර්දේශ මත කළ බව පිළිගන්නේද?

(එ) ඔබේ වගකීම ප්‍රධාන අමාත්‍යතුමා වෙත පැවරීමට හේතු දක්වන්නේද?

9. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, ප ළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට :

(ප්‍ර/vi(1)/16/52)

(අ) කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල සීමාව තුල අංගොඩ පන්සල් වත්තෙන් පටන්ගෙන තලතෙල් බෝක්කුව දක්වා දිවෙන ඇළ මාර්ගයක් පවතින බව ඔබතුමා දන්නේද?

(ආ) එම ඇළෙහි නම කුමක්ද? එම ඇළ ඇතුලත් පිඹුර සභාගත කළ හැකිද?

(ඇ) මෙම ඇළ දෙපස අනවසර ඉදිකිරීම් රාශියක් පවතින බව ඔබතුමා පිළිගන්නේද?

(ඈ) ඉහත ඇළ කුඩා වැස්සකට වුවද පිටාර ගලන බව ඔබතුමා පිළිගන්නේද?

(ඉ) මේ පිළිබඳව කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ඇතුළු බලධාරීන්ගේ අවධානයට ලක්කලත් මේ දක්වා කිසිදු ප්‍රතිසංස්කරණයක් සිදුකර නොමැතිබව ඔහතුමා පිළිගන්නේද?

(ඊ) එම ඇළ කඩිනම් ප්‍රතිසංස්කරණයකට ලක්කිරීමට ඔබතුමා පියවර ගන්නේද? නොඑසේනම් ඒ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01 . ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා:**

'අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නව රජය මගින් පසුගිය රජය විසින් කරන ලදැයි කියන දූෂණ, වංචා, මිනීමැරුම්, රාජ්‍ය දේපල අයුතු ලෙස පරිහරණය කිරීම පිළිබඳව මේ වන විටත්, ඒ සඳහා කමිටු පත් කරමින් වැරදි කරුවන්ට නීතිය මගින් දඬුවම් කිරීම සතුටට කරුණකි.

1989 හා 1990 කාල වකවානුව තුළ තරම් මෙරටේ අති විශාල වශයෙන් රාජ්‍ය දේපල විනාශ කරමින් මිනිස් ඝාතන සිදු වූ කාල පරිච්ඡේදයක් මෑත ලංකා ඉතිහාසයේ නොමැත. එබැවින් මේ පිළිබඳව සොයාබැලීමට කමිටුවක් පත් කර එම රාජ්‍ය දේපල විනාශ කර මිනිස් ඝාතන සිදු කළ පුද්ගලයන්ට නීතිය මගින් දඬුවම් කිරීම හා විනාශ කළ රාජ්‍ය දේපලවල වටිනාකම අදාල වැරදිකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා මෙන් අතිගරු ජනාධිපතිතුමාගෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව ඉල්ලා සිටියි.'

(යෝ/vi(1)/15/02)

**02. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා :**

'පාසැල්වලට ළමුන් ඇතුළත් කර ගැනීම දැඩි අර්බුදකාරී තත්වයකට පත්ව ඇත.

පළමුවන ශ්‍රේණියට සහ හය වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා අනෙකුත් ශ්‍රේණි වලට ළමුන් ඇතුළත් කර ගන්නා ක්‍රමවේදයට සාපේක්ෂව වඩා විධිමත්වූ වැඩ පිළිවෙළක් සකස් වී තිබුණද, එම අනෙකුත් ශ්‍රේණි සඳහා ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා එවන් විධිමත් වැඩපිළිවෙලක් නොමැත. ඒ නිසාම ළමුන් ඇතුළත් කර ගැනීමේදී විවිධ අල්ලස් ගැනීම්, දූෂණ, විවිධ අක්‍රමිකතා සිදු වෙමින් පවතින බව දැනගන්නට ඇත.

එහෙයින්, පළමුවන ශ්‍රේණියට සහ හය වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේදීදැනට ක්‍රියාත්මක වන්නාක් මෙන්ම අනෙකුත් ශ්‍රේණි වලටද ළමුන් ඇතුළත් කිරීම සඳහා වඩා විධිමත් වූ ක්‍රමවේදයන් සකස් කර බස්නාහිර පළාතේ පාසැල් වලට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් අදාල සියළු පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ, පළාත් සභාව අදහස් කරයි.'

(යෝ/vi(1)/15/04)

## X . සභාව කල් තැබීම

2016.06.08 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.